## ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව - 2017

---

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1971 අංක 47 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 31(1) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 –1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම

1999 වර්ෂයේදී ජාතික චිත්‍රපට සංස්ථාව සතුව පැවති චිත්‍රපටි බෙදාහැරීමේ ඒකාධිකාරය අහෝසි කිරීමත් සමග සංස්ථාව සතුව පැවති ප්‍රධාන ආදායම් මාර්ගයක් වූ චිත්‍රපටි බෙදා හැරීමේ කොමිස් මුදල අහිමි වී තිබුණි. ඒ හේතුවෙන් සංස්ථාවේ ආදායම, වියදම් පියවා ගැනීමට ප්‍රමාණවත් නොවීම මත මහා භාණ්ඩාගාරය විසින් 2001 වර්ෂයේ සිට සේවක වැටුප් සඳහා ප්‍රතිපාදන ලබාදීමට කටයුතු කර තිබුණි.

තවද, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක කාලය තුළ සංස්ථාව භාණ්ඩාගාර ප්‍රදාන ලැබීමට පෙර දිගින් දිගටම අලාභ ලැබීමේ තත්ත්වයක් නිරීක්ෂණය වූ අතර ඒ අනුව රජයේ මූල්‍ය සහායක් නොමැතිව සංස්ථාව අඛණ්ඩව පවත්වා ගෙන යාම අවිනිශ්චිත තත්ත්වයක පවතින බව නිරීක්ෂණය විය.

## 1.5 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ජාතික චිත්‍රපට සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

**(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 1**

(i) සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා 2006 ජනවාරි සිට 2015 දෙසැම්බර් දක්වා ජීවන වියදම් දීමනාව සැලකිල්ලට නොගෙන දායක මුදල් ගණනය කිරීම හේතුවෙන් රු. 2,763,753 ක හිඟ මුදලක් සහ රු. 1,381,876 ක අධිභාරයක් ගෙවීමට සිදුව තිබූ අතර ඒ සඳහා 2017 අප්‍රේල් 27 දින අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණද ප්‍රමිතයේ 27 වන වගන්තිය ප්‍රකාරව ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

**(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 7**

ප්‍රමිතයේ 7 වන වගන්තිය අනුව, භාණ්ඩාගාර බිල්පත් සහ ප්‍රතිවිකුණුම් බිල්පත් ගිණුම්ගත කිරීමේදී මාස 3ක් හෝ ඊට අඩු කාලයකදී කල්පිරෙන ආයෝජනයන් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මුදල් හා මුදල් සමාන වත්කමක් ලෙස පෙන්නුම් කළ යුතු වුවද මාස තුනක කාලයක් තුළදී කල් පිරීමට නියමිත රු.6,863,993 ක භාණ්ඩාගාර බිල්පත් හා රු.97,461,399 ක ප්‍රතිවිකුණුම් බිල්පත් මුදල් හා මුදල් සමාන දෑ යටතේ දැක්වීම වෙනුවට මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන යටතේ දක්වා තිබුණි.

**(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16**

(i) ප්‍රමිතයේ 79 (අ) ඡේදය ප්‍රකාරව නිෂ්කාර්ය වත්කම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල ශුද්ධ පොත් අගය හෙළිදරව් කළයුතු වුවත් සංස්ථාවේ කැලණිය චිත්‍රාගාරයේ කලුසුදු සහ වර්ණ රසායනාගාරවලට අයත් තාක්ෂණය යල්පැනගිය පැරණි නිශ්කාර්ය වත්කම්, ගිණුම්ගත කිරීම හා ඒ පිළිබඳව හෙළිදරව් කිරීම සිදුකර නොතිබුණි.

(ii) ප්‍රමිතයේ 51 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 69,032,058 ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තව දුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(iii) ප්‍රමිතයේ 34 ඡේදය ප්‍රකාරව, ප්‍රත්‍යාගණන වත්කමක සාධාරණ වටිනාකම එහි ධාරණ අගයෙන් ප්‍රමාණාත්මක ලෙස වෙනස් වන විට එම දේපල ප්‍රත්‍යාගණනය කළ යුතුය. එහෙත් සංස්ථාවට අයත් බෞද්ධාලෝක මාවතේ පිහිටි වරිපනම් අංක 224 දරන ඉඩම සහ කැලණිය චිත්‍රාගාරයේ ඉඩම 2007 වර්ෂයේදී අවසාන වරට තක්සේරු කර තිබූ අතර ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රත්‍යාගණනය කර වසර 11 ක් ගත වී තිබුණද මෙම ඉඩම් නැවත තක්සේරු කර සාධාරණ අගය ගිණුම්ගත කිරීමට කටයුතුකර නොතිබුණි.

**(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19**

ප්‍රමිතයේ 57 ඡේදය ප්‍රකාරව, ආයුගණක තක්සේරුවක් සිදුකර පුරෝකථනය කළ ඒකක බැර ක්‍රමය ප්‍රකාරව පශ්චාත් සේවක ප්‍රතිලාභ වෙන්කිරීම් ගණනය කළ යුතු වුවත්, ඊට පටහැනිව ආයතනය විසින් පශ්චාත් සේවක ප්‍රතිලාභ වෙන් කිරීම් සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනාගැනීමකින් තොරව සෑම සේවකයෙකුටම සේවය කරන ලද එක් වර්ෂයකට මාස භාගයක වැටුපට සමාන පාරිතෝෂික මුදලක් වෙන් කර තිබුණි.

**(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 24**

පාලක මණ්ඩලයේ අධ්‍යක්ෂවරියකට ලබා දී තිබූ චිත්‍රපට නිෂ්පාදන ණය ශේෂය වන රු.1,732,530 ක් සම්බන්ධයෙන් ප්‍රමිතයේ 26(ආ) වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

**(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 38**

**-----------------------------------**

ප්‍රමිතයේ 119 ඡේදය ප්‍රකාරව කැලණිය සරසවි චිත්‍රාගාරයේ පශ්චාත් නිෂ්පාදන කටයුතු සඳහා භාවිතා කරන මෘදුකාංගය මූල්‍ය ප්‍රකාශනවල අස්පෘශ්‍ය වත්කම් යටතේ දැක්විය යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

**(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 40**

**-----------------------------------**

ප්‍රමිතයේ 75 (ඇ) ඡේදය ප්‍රකාරව, ආයෝජන වත්කම් මූල්‍ය ප්‍රකාශනවල ආයෝජන වත්කම් ලෙස හඳුනාගෙන ගිණුම් ගත කළ යුතු වුවත් සංස්ථාව විසින් වසර 16 ට වැඩි කාලයක් තුළ රඟුම් පාලක මණ්ඩලය, සැලසිනේ ආයතනය සහ සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානයට කුලියට ලබාදී ඇති ගොඩනැගිල්ලක් පිළිබඳව සුදුසු අනාවරණය කිරීම් සිදු කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

සමාලෝචිත වර්ෂයේදී ජනාධිපති සම්මාන උළෙල සඳහා ලැබී තිබූ රජයේ ප්‍රදාන රු.මිලියන 33 ක් ආදායමක් ලෙස හඳුනාගැනීමකින් තොරව ජනාධිපති සම්මාන උළෙලේ වියදමට එරෙහිව කපාහැර තිබුණි.

### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

**-----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාවේ පොත්පත් සහ රිත්මා මණ්ඩලයේ පොත්පත් අනුව අන්තර් දෙපාර්තමේන්තු ජංගම ගිණුමක රු.5,763,596 ක පැහැදිලි නොකළ වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිවිකුණුම් ආයෝජනයේ බැංකු තහවුරු අනුව ශේෂය රු.171,078,340 ක් වුවද මූල්‍ය ප්‍රකාශන අනුව රු.171,694,038 ක් වූයෙන් රු.615,698 ක පැහැදිලි නොකළ වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනට චිත්‍රපට තොගයේ වටිනාකම රු.5,253,875 ක් වුවද ගිණුම් අංශයේ වාර්තා අනුව චිත්‍රපට තොගයේ රු.718 ක් වටිනා දේශීය චිත්‍රපට 3 ක් සහ විදේශීය චිත්‍රපට 9 ක් පමණක් පැවතුණි.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම්

-----------------------------------

ණයගැති වටිනාකම රු. 58,466,046 ක් සඳහා ස්වාධීන ශේෂ තහවුරු කිරීම් කැඳවා තිබූ නමුත් රු.11,088,220 ක් වටිනා ලිපි වැරදි ලිපිනයන් හේතුවෙන් ආපසු ලැබී තිබූ අතර රු.47,377,826 ක් වටිනා ලිපි සඳහා ශේෂ තහවුරු කිරීම් එවා නොතිබුණි. ඒ අනුව ඉහත ණයගැති ශේෂ විගණනයේ දී සනාථකර ගැනීමට නොහැකි විය.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මරදාන සිනේසිටි සිනමා ශාලාවෙන් 2003 වර්ෂයේ සිට 2016 මැයි 31 දින දක්වා අයවිය යුතු චිත්‍රපට කුලිය රු. 12,343,433 ක් මෙම වාර්තාවේ දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, 2016 මැයි 31 දිනට පසු දෛනික වාර්තාව ලබාගෙන නොමැතිවීම හේතුවෙන් අයවිය යුතු චිත්‍රපට කුලී ආදායම ගණනය කිරීමට සහ ගිණුම්ගත කිරීමට නොහැකි වී තිබුණි.

(ආ) කොටහේන සිනේවර්ල්ඩ් සිනමාශාලා සංකීර්ණය වෙනුවෙන් ලබා දී තිබූ රු.1,009,548 ක ණය, චිත්‍රපට කුලිය හා සංස්ථාභාරය, පොලිය සහ හරපත් මුදල් ලෙස 2017 දෙසැම්බර් 31 දිනට ගෙවීම පැහැර හැර තිබූ රු.19,332,544 ක් අයකර ගැනීමට නිත්‍යානුකූලව ක්‍රියාකර නොතිබුණි.

(ඇ) ස්වෙච්ඡාවෙන් සේවකයින් විශ්‍රාම ගැන්වීම වෙනුවෙන් 1997 වර්ෂයේදී භාණ්ඩාගාරයෙන් ලැබී තිබූ වන්දි මුදලින් ඉතිරිව පැවති රු. 5,000,000 ක් නැවත භාණ්ඩාගාරයට ප්‍රේෂණයකර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 10(5) සහ 11 වන වගන්තිය සහ චිත්‍රපට සංස්ථාවේ 1971 අංක 47 දරන පනතේ 27 වන වගන්තිය | 2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වූ වියදම් ඉක්ම වූ ආදායම රු. 140,531,882 ක් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර නොතිබුණු අතර 2017 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිවිකුණුම්වල පිළිවෙලින් රු.100,117,116 ක් හා රු. 173,097,656 ක් මුදල් ඇමතිවරයාගේ හා අදාළ ඇමතිවරයාගේ අනුමැතියකින් තොරව ආයෝජනය කර තිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 381(1) | රාජකාරී බැංකු ගිණුම් ආරම්භ කිරීම සඳහා ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා මගින් මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගත යුතු වුවත්, 2017 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.90,549,292 ක්වූ බැංකු ජංගම ගිණුම් 08 ක් සංස්ථාව විසින් පවත්වාගෙන යමින් තිබූ නමුත් ඒ සඳහා භාණ්ඩාගාර |

අනුමැතිය ලබාගෙන තිබූ බවට තහවුරුවක් නොතිබුණි.

| | | |
|---|---|---|
| (ඇ) | 2015 ජූලි 22 දිනැති අමප/05/0741/041/012 අංක දරන අමාත්‍ය මණ්ඩල තීරණය | රාජ්‍ය ආයතනවලින් බැහැර කෙරෙන තඹ, පිත්තල, ඇලුමිනියම්, ඊයම් ආදී යකඩ නොවන ලෝහද විශේෂ වර්ගයන්හි යකඩ, වීනච්චට්ටි, හා වානේ සුන්බුන්ද ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයට අලෙවි කළ හැකි වුවත්, සරසවි චිත්‍රාගාරයේ පැරණි ගොඩනැගිල්ලක ගොඩගසා තිබූ යකඩ, සුන්බුන් හා දළ සේයාපට ආවරණ සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | 1999 ජුනි 17 දිනැති ජාතික චිත්‍රපට ප්‍රතිපත්තිය හා මාර්ගෝපදේශය 9 වගන්තිය | චිත්‍රපට සුරක්ෂිතාගාරයක් පිහිටුවා එහි කළමනාකරණය චිත්‍රපට සංස්ථාව විසින් පවත්වාගෙන යා යුතු වුවත් චිත්‍රපට සංස්ථාව සතු පැරණි චිත්‍රපට 273 ක් පමණ ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ සුරක්ෂිතාගාරයක තැන්පත් කර තිබුණි. කෙසේ වෙතත් 1947 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා තිරගත වූ චිත්‍රපට 962 ක් සහ නව චිත්‍රපටවල පිටපත් සුරක්ෂිත කිරීම සඳහා වැඩපිළිවෙලක් සකස්කර නොතිබුණි. |
| (ඉ) | සුරාබදු නිවේදන අංක 902 හි 111 උපලේඛනයේ (ඒ) හා (සී) වගන්තිය | පූජනීය ස්ථානයකට හෝ පාසලකට මීටර් 500 ක් ඇතුළත හා රටබීම විකුණන ස්ථානයේ තිබිය යුතු වපසරිය වර්ග අඩි 500 කට අඩුනම් රටබීම අලෙවි බලපත්‍ර නිකුත් නොකළ යුතු නමුත් ඒ පිළිබඳ පරීක්ෂාවකින් තොරව සිනමාහල් 47 කට රටබීම අලෙවි බලපත්‍ර සඳහා නිර්දේශ නිකුත් කර තිබුණි. |
| (ඊ) | 2017 ජනවාරි 23 දිනැති ප්‍රසිද්ධ රැගුම්පාලක මණ්ඩලය සමාන බැඳුනු අංක 4711 දරන බදු ගිවිසුමේ 6 ඡේදය | සංස්ථාවේ ලිඛිත අනුමැතියකින් තොරව බද්දට දී ඇති ගොඩනැගිල්ලට කිසිදු වෙනස් කිරීම් හා එකතු කිරීම් නොකළ යුතු වුවත් බදු දී ඇති රැගුම් පාලක මණ්ඩලයේ ගොඩනැගිල්ලට අනුමැතියකින් තොරව එකතු කිරීම් සිදුකර තිබුණි. |
| (උ) | 1971 අංක 47 දරන ජාතික චිත්‍රපට සංස්ථාව පනතේ වගන්තිය 7(2) (අ) (i) | අධ්‍යාපන විෂයය හෝ කාර්යභාර අමාත්‍යවරයා විමසීමෙන් පසුව විශ්ව විද්‍යාල නියෝජනය කරන සාමාජිකයින් දෙදෙනකු සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් ලෙස පත්කළ යුතු වුවත් එම පත්කිරීම් සිදු කර නොතිබුණි. |

**2.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

---------------------------------------------------------------

විධිමත් අධිකාරී බලයකින් තොරව ගිණුම් ලිපිකරුවන්ගේ අනුමැතිය මත අඩමාන ණය හානිකරණ ගැලපීම් ලෙස රු.14,736,803 ක් වටිනා ජර්නල් සටහන් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂය සඳහා සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵලය භාණ්ඩාගාර ප්‍රදාන ලැබීමට පෙර රු.51,970,405 ක අලාභයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අලාභය රු.34,638,806 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.17,331,599 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. විදේශීය චිත්‍රපටි බෙදා හැරීමේ කොමිස් ආදායම රු.9,157,132 කින් පහළ යාම සහ බොල්ණය සඳහා හානිකරණ ගැලපීම රු.11,926,984 කින් වැඩිවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී භාණ්ඩාගාර ප්‍රදාන ලැබීමට පෙර මූල්‍ය ප්‍රතිඵලවල අඛණ්ඩ අලාභයක් ඇති වී තිබුණු අතර 2013 වර්ෂයේදී රු. 58,337,827 ක් වූ එය සමාලෝචිත වර්ෂය අවසානයට රු.51,970,405 ක් වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමෙන් පසු 2013 වර්ෂයේදී රු.19,157,095 ක් වූ සංස්ථාවේ දායකත්වය සමාලෝචිත වර්ෂය අවසානයට රු.52,207,037 ක් දක්වා වර්ධනයට වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1. සැලසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාලව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබූ නමුත් එම සැලැස්ම සංයුක්ත සැලැස්මේ අරමුණු පාදක කරගෙන පිළියෙල කර නොතිබුණි. තවද ක්‍රියාකාරී සැලැස්මේ කාර්තුමය වශයෙන් ඉලක්කගත ක්‍රියාකාරකම් හඳුනාගෙන තිබුණ ද කාර්යසාධනය ඇගයීමට හැකිවන පරිදි කාර්යසාධන වාර්තා පිළියෙල කර නොතිබුණි.

(ආ) කැළණියේ පිහිටි සරසවි චිත්‍රාගාරයේ නිෂ්පාදන පහසුකම් වැඩිදියුණු කිරීම, සඳහා රු.මිලියන 25 ක් සහ චිත්‍රපට සංරක්ෂණාගාරය පිහිටුවීම සහ චිත්‍රපට ප්‍රතිෂ්ඨාපනය සඳහා රු.මිලියන 50 ක් වෙන්කර තිබුණද සමාලෝචිත වර්ෂය තුල එම මුදල උපයෝජනයකර නොතිබුණි. තවද, චිත්‍රපට කලාකරුවන්ගේ සහ තාක්ෂණික ශිල්පීන්ගේ ධාරිතා වර්ධනයට ජාතික පුහුණු පාසලක් පිහිටුවීම සඳහා වෙන්කර තිබූ රු.මිලියන 50 කින් රු.500,000 ක් පමණක් පස් පරීක්ෂාව සඳහා වැය කර තිබුණු අතර එම ව්‍යාපෘතියේ ඉතිරි කටයුතු සිදුකර නොතිබුණි.

**4.1.2. ක්‍රියාකාරීත්වය සහ සමාලෝචනය**

---------------------------------------

සෑම සිනමා ශාලාවක්ම අවම වශයෙන් මාසයකට එක් වතාවක් පරීක්ෂාවට ලක්වන පරිදි එනම් සමස්තයක් ලෙස දර්ශන වාර 1500 ක් වත් පරීක්ෂා කිරීමට සැලසුම් කර තිබු නමුත් සමාලෝචිත වර්ෂය තුළ දර්ශන වාර 850 ක් පමණක් පරීක්ෂාවට ලක්කර තිබුණි.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සිනමා ශාලාවලින් අයවිය යුතු හිඟ මුදල් සහ චිත්‍රපට නිෂ්පාදනය සඳහා ලබාදී ඇති ණය මුදල් රු.මිලියන 192 ක් කපා හැරීම සඳහා සංස්ථාව විසින් අනුමැතිය ඉල්ලීමේ ලිපියට පිළිතුරු ලෙස 2015 අගෝස්තු මාසයේ අංක පීඊ/එම්ඊ/එන්එෆ්සී/පොදු/2015 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු අධ්‍යක්ෂක ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව හිඟ ආදායම් අයකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් කාර්යයභාර ඉටුකර නොතිබූ බව නිරීක්ෂණය විය.

(i) රාජ්‍ය ව්‍යවසායන් පිළිබඳ පාර්ලිමේන්තු කමිටුව (COPE) විසින් ද නිර්දේශ කර ඇති පරිදි අමාත්‍යාංශ මට්ටමේ කමිටුවක් පත් කර හිඟ මුදල් රැස්කර ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කරන මෙන් උපදෙස් ලබාදී තිබුණද ,පත්කර ඇති කමිටුව සඳහා අමාත්‍යාංශයේ නියෝජනයක් සිදුවී නොතිබීම.

(ii) අදාළ ණය මුදල් අයකර ගැනීම සඳහා ඇති නෛතිකමය හැකියාව පිළිබඳ විමර්ශනය කර නොමැති වීම සහ එසේ විමර්ශනය කිරීම තුළින් හඳුනාගනු ලබන ණයගැතියන්ගෙන් නීති ප්‍රකාරව, අදාළ හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබීම.

(iii) අවම වශයෙන්, දැනට ක්‍රියාත්මක සිනමා ශාලාවලින්, වාරික වශයෙන්, දීර්ඝ කාලීනව හෝ ලබාදී ඇති ණය මුදල් පියවා ගැනීමට විධිමත් ක්‍රියා පටිපාටියක් ඉහත ණය කමිටුවෙන් ඉදිරිපත් වී නොතිබීම.

(iv) ඉහත (ii ) හා (iii) අයකරගත හැකි ණය මුදල හැර ඉතිරි මුදල කපා හැරීම සඳහා අමාත්‍ය මණ්ඩලයට කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතු බව දන්වා තිබුණද එසේ සිදුකර නොතිබීම.

(ආ) සංස්ථාවේ ගොඩනැගිල්ල ස්ථාපනය කර ඇති බෞද්ධාලෝක මාවතේ වරිපනම් අංක 303 දරන ඉඩමේ නෛතික හිමිකම ලබා ගැනීමට හා ඉඩමේ වටිනාකම ගිණුම්ගත කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය වනවිටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිවිකුණුම්වල වටිනාකම රු.273,214,772 ක් වූ අතර එකම බැංකුවක දිගින් දිගටම ආයෝජනය කර තිබූ අතර ප්‍රාථමික වෙළඳපලේ රාජ්‍ය

බැංකු වලින්  මිල ගණන් කැඳවා වඩා වාසි දායක පොලී අනුපාත මත ආයෝජන කිරීම පිළිබඳ කළමනාකරණයේ අවධානය යොමු කර නොතිබුණි.

## 4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 මාර්තු 31 දින පවත්වනු ලැබූ ජනාධිපති  සිනමා සම්මාන උළෙල සඳහා මූල්‍ය ප්‍රකාශන අනුව රු.44,394,717 ක වියදමක් ගිණුම්ගතකර තිබූ අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) මෙම උළෙල සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3:2:1 මාර්ගෝපදේශය පරිදි තරඟකාරී මිල ගණන් කැඳවීමකින් ආයතනයක් තෝරා ගත යුතු වුවත් ඉන් බැහැරව ප්‍රචාරණ කටයුතු හා ප්‍රචාරණ වැඩසටහන් පමණක් සැලසිනේ ආයතනයට පැවරීම සඳහා ලබාදී තිබුණු 2008 දෙසැම්බර් 2 දිනැති අංක 08/2253/338/043 දරණ අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනිව වේදිකාව සැකසීම, ආලෝකරණය හා කලාත්මක කටයුතුද සැලසිනේ ආයතනයට පවරා තිබුණි.

(ii) සම්මාන උළෙල සඳහා සංස්ථාව විසින් රු.38,170,000 ක මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකසා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබූ අතර එහි ඉසව් කළමනාකරණය වෙනුවෙන් රු.19,400,000 ක් පමණක් වෙන්කර තිබියදී සැලසිනේ ආයතනයේ ඉසව් කළමනාකරණය වෙනුවෙන් ලබා ගෙන තිබූ මිල ඇස්තමේන්තුව වූ රු.27,682,469 ක (බදු රහිත) මුදලට 2017 පෙබරවාරි 23 දින ගිවිසුම්ගත වී තිබුණි. මේ අනුව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය අභිබවා රු.8,282,469 ක් වූ මුදලකට ගිවිසුම් ගත වී ගෙවීමට කටයුතුකර තිබුණි.

(iii) තාක්ෂණික ඇගයීම් කමිටුව මෙකී කාර්යයට අදාළ වාර්තා 6 ක් ලබා දී තිබූ අතර ඉන් වාර්තා 2 ක් 2017 මාර්තු 30 දාතමින් විය. උත්සවය පවත්වා තිබුණේ 2017 මාර්තු 31 දින විය. උත්සවය පැවැත්වීමෙන් පසුද වාර්තා 2 ක් ලබා දී තිබුණි.මේ අනුව තාක්ෂණික ඇගයීම් කමිටුවල කාර්යභාරය නිවැරදි ලෙස ඉටු වී නොතිබුණු බව නිරීක්ෂණය විය.

(iv) උක්ත (ii) හි ගිවිසුම් ගත රු. 27,682,469 ක් තුළ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ වේදිකාව සැකසීමට රු.3,103,750 ක්ද වේදිකාවේ ආලෝකකරණ පද්ධතිය සඳහා රු.1,943,500 ක්ද හා වේදිකාවේ අනෙකුත් කලාත්මක කටයුතු සඳහා රු.2,587,500 ක් ද වශයෙන් එකතුව රු.7,654,750 ක අසාමාන්‍ය මුදලක් ඇතුළත් කර තිබුණි.

(v) සැලසිනේ ආයතනය සමග වූ රු.27,682,469 ක ගිවිසුම් ගත මුදල තුළ ආහාර හා පාන වර්ග වෙනුවෙන් රු.1,955,500 ක් පමණක් ඇතුළත්ව තිබුණද විගණිත අවස්ථාව වන විට රු.6,250,000 ක මුදලක් සැලසිනේ ආයතනයට ගෙවා තිබූ අතර ඒ අනුව රු.4,294,500 ක මුදලක් ගිවිසුමට පටහැනි ලෙස ගෙවීම්කර තිබුණි.

(vi) විගණනයට ඉදිරිපත් කළ ගිණුම් අනුව උළෙල සඳහා සමස්ත වියදම රු.44,394,717 ක් ලෙස දක්වා තිබුණු අතර ඒ තුළ ගිවිසුම්ගත මුදල ඉක්මවා සැලසිනේ ආයතනයට ගෙවිය යුතු ලෙස රු.9,854,285 ක් උපචිත වියදම් ලෙස හඳුනා ගෙන ගිණුම් ගත කර තිබුණි. කෙසේ වුවද, එම උපචිත වියදමට අදාලව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබූ අතර ගිණුම් නිලධාරී විසින් ජර්නල් වවුචර් සහතික කර තිබුණි. තවද, එම උපචිත වියදම සනාථ කිරීමට බිල්පත් හෝ වෙනත් සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

(vii) ජනාධිපති සම්මාන උළෙල වෙනුවෙන් සැලසිනේ ආයතනය සමග ගිවිසුම්ගත මුදල රු.27,682,489 ක් වුවද විගණිත දිනවන විට රු.27,000,000 ක් ගෙවා තිබූ අතර 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන අනුව තවදුරටත් රු.9,854,285 ක් උපචිත වියදම් ලෙස ගිණුම් ගතකර තිබුණි. මේ අනුව ගිවිසුම් මුදල අභිබවා ගෙවීමට සැලසුම්කර තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) (i) සංස්ථාවේ අරමුණට කිසිදු සම්බන්ධතාවයක් නොමැතිව සහ පදනම් කරගත් නෛතික විධිවිධානයකින් තොරව රිත්මා මණ්ඩලයේ සිනමාශාලා 18 කට වර්ෂ කිහිපයක සිට සහ අනෙකුත් මණ්ඩල සිනමාහල් 29 ක් සඳහා සමාලෝචිත වර්ෂයේදී රටබීම අලෙවි බලපත්‍ර නිර්දේශ කර තිබුණි. කෙසේ වුවද නිකුත් කර ඇති බලපත්‍ර ප්‍රකාරව රටබීම අලෙවි කළ හැක්කේ නරඹන්නන් සඳහා පමණක් වුවද 2017 නොවැම්බර් මස සබරගමුව පළාතේ සිනමාහල් 2 ක් සම්බන්ධයෙන් සිදුකළ භෞතික පරීක්ෂාවේදී දින 9 ක් සඳහා චිත්‍රපට ප්‍රදර්ශනය වෙනුවෙන් අලෙවි වූ ප්‍රවේශ පත්‍ර සංඛ්‍යාව 4 ක් වූ අතර මධ්‍යසාර අලෙවියෙන් ලද ආදායම රු.405,690 ක් වූයෙන් නරඹන්නන් නොවන පිරිස් වලට රටබීම අලෙවි කර තිබූ බව නිරීක්ෂණය විය.

(ii) රාජ්‍ය අනුග්‍රහය යටතේ රටබීම අලෙවි බලපත්‍ර නිකුත් කිරීම ශ්‍රී ලංකා රජයේ “මතට තිත” ප්‍රතිපත්තියට එරෙහි ක්‍රියාවක් වන අතර, පවුලේ චිත්‍රපට සහ ළමා චිත්‍රපට ප්‍රදර්ශනය වන අවස්ථාවන්හිදී පවා රටබීම පානය සඳහා අවකාශය සැලසෙන පරිදි සිනමා ශාලා සඳහා රටබීම බලපත්‍ර නිර්දේශ කර තිබීම මතභේදාත්මක කරුණක් ලෙස නිරීක්ෂණය කෙරේ.

## 4.4 මෙහෙයුම් ක්‍රියාකාරකම්

----------------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට සිනමාහල් නිෂ්පාදකයන් හා වෙනත් ණය සහ සේවක අත්තිකාරම් වශයෙන් මුළු ණය එකතුව රු. 578,661,380 ක් අයකර ගත යුතුව තිබුණි. එම ණයගැතියන්ගෙන් රු.161,470,386 ක් සඳහා හානිකරන ගැලපීමක් ද රු.119,490,277 ක් සඳහා අධිභාර වෙන් කිරීමක්ද රු.4,618,805 ක් නිෂ්පාදන ණය පොලී වෙන් කිරීමක්ද සිදු කර තිබුණි. කෙසේ වුවද ඉහත ණයගැතියන් ගෙන් රු. 285,579,469 ක් හෙවත් සියයට 49 ක් ආපසු අයකර ගැනීම අවිනිශ්චිත බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 4.5 අරමුදල් ඌන උපයෝජනය

----------------------------------

සංස්ථාව සතු ජංගම බැංකු ගිණුම් 8 ක 2017 වර්ෂයේ සාමාන්‍ය මාසික ශේෂය රු. 50,503,509 ක් වු අතර අතිරික්ත මුදල් කෙටිකාලීනව ආයෝජනය කිරීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.

**4.6 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) එකතුව රු. 870,659 ක් වූ දළ සේයාපට සහ රසායන ද්‍රව්‍ය තොගයක් 2014 වර්ෂයේ සිට අභාවිතව පැවතුණි.

(ආ) ප්‍රධාන කාර්යාලයේ සුහසාධක සංගමයෙන් ලබා දී තිබූ පුස්තකාල පොත් 500 කට අධික ප්‍රමාණයක් කැලණිය සරසවි චිත්‍රාගාරය තුළ අනාරක්ෂිතව ගොඩගසා තිබීම හේතුවෙන් දිරාපත් වෙමින් පැවැතුණි.

**4.7 කාර්යමණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 71 ක් වූ අතර වර්තමාන අවශ්‍යතාවයන් අනුව අනුමත කාර්ය මණ්ඩලය සමාලෝචනය කර නොතිබුණි. ඒ අනුව, අත්‍යාවශ්‍ය මාණ්ඩලික තනතුරු 02 ක්, දීර්ඝ කාලයක සිට පුරප්පාඩු වී තිබීම හේතුවෙන් සැලසුම් සකස් කිරීමේදී, ඉලක්කයන් ගොඩනැගීමේදී හා එකී ඉලක්ක ළඟාකර ගැනීමට මෙහෙයවීමේදී නිසි මඟ පෙන්වීමක් සහ අධීක්ෂණයක් නොපැවති බව නිරීක්ෂණය විය.

(ආ) සංස්ථාවේ බඳවාගැනීමේ පරිපාටියේ 4.1.1. වගන්තිය ප්‍රකාරව, පශ්චාත් උපාධියක් ලැබීමෙන් පසු ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 10 ක පළපුරුද්ද ඇති නිලධාරියෙකු සාමාන්‍යාධිකාරී ලෙස පත් කළ යුතු වුවත්, එම සුදුසුකම් නොමැති නිලධාරියකු කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන සමාලෝචිත වර්ෂය තුළදී වැටුප් සහ දීමනා ලෙස එකතුව රු.1,671,808 ක මුදලක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව ගෙවා තිබුණි.

(ඇ) බඳවා ගැනීමේ පරිපාටියෙන් බැහැරව සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමකින් හෝ අමාත්‍යාංශ ලේකම්වරයාගේ නිර්දේශය සහිතව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව රියදුරෙකු බඳවා ගෙන මාසික දීමනා සහ අතිකාල ලෙස රු.738,000 ක් ගෙවා තිබුණි.

**5. තිරසාර සංවර්ධනය**

**5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

---

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව සංස්ථාව විසින් තම විෂයපථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබූ අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කාර්යසාධනය මැනීම සඳහා නිවැරදි දත්ත පදනමක් පැවතීම අත්‍යවශ්‍ය වුවත්, සංස්ථාව විසින් තිරසාර සංවර්ධන ඉලක්කයන්හි ළඟාවීම මැන බැලීම සඳහා නිවැරදි දත්ත පදනමක් බිහි කර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ආ) තිරසර සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීමට සූදානම් වීමේදී අනෙකුත් ආයතන සමඟ මනා සම්බන්ධීකරණයක් නොතිබීම හේතුවෙන් ඉලක්ක ගත අරමුණු කරා ළඟා වීමට සැලසුම් සකස් කිරීමේ හා පෙර සූදානම්වීමේ ක්‍රියාවලිය ඉතා මන්දගාමීව හා දුර්වල තත්ත්වයක පැවති බව නිරීක්ෂණය විය.

**6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

---

**6.1 ප්‍රසම්පාදනයන්**

---

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ආ) වගන්තිය ප්‍රකාරව, අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත්කර ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් හා 4.2.2 අනුව ප්‍රසම්පාදන කාල සටහනක් සකස් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය සඳහා පමණක් ප්‍රසම්පාදන සැලැස්ම සකස්කර තිබුණි.

**6.2 අභ්‍යන්තර විගණනය**

---

අනුමත කාර්ය මණ්ඩලයට අනුව අභ්‍යන්තර විගණන අංශයේ ස්ථිර විගණන සහායක තනතුරු 03 ක් තිබිය යුතු වුවද 2017 දෙසැම්බර් 31 දින වන විට කිසිදු සහායකයකු සේවයේ යොදවා නොතිබුණි. ඒ අනුව අභ්‍යන්තර විගණන කටයුතු සම්බන්ධයෙන් සංස්ථාව ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොමැති බව නිරීක්ෂණය විය.

**6.3 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

---

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ප්‍රකාරව 2015 හා 2016 වර්ෂවල වාර්ෂික වාර්තා 2018 අගෝස්තු 24 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**7. පද්ධති හා පාලනයන්**

---

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින්වර සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුවේ.

| **පද්ධති හා පාලන ක්ෂේත්‍ර** | **නිරීක්ෂණ** |
| --- | --- |
| (අ) වත්කම් පාලනය | (i) චිත්‍රාගාරයේ තිබෙන නිෂ්කාර්ය වත්කම් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැනීම.<br>(ii) පුස්තකාල පොත් ආරක්ෂිතව පවත්වා නොගැනීම.<br>(iii) ඉන්වෙන්ට්‍රි ලේඛනය ලැබීම් නිකුත් කිරීම් හඳුනා ගැනීමට පහසු වන ආකාරයෙන් නිසි පරිදි නඩත්තු කර නොතිබීම. |
| (ආ) ණයගැති පාලනය | (i) වර්ෂ 10 කට වඩා අයනොවී පවතින ණය ශේෂ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැනීම.<br>(ii) ණය ගිවිසුම් පිළිබඳ නිසි අධීක්ෂණයක් නොතිබීම.<br>(iii) ණය අයකර ගැනීමේ වැඩ පිළිවෙලක් හෝ අංශයක් පිහිටුවා නොතිබීම. |
| (ඇ) ආදායම් පාලනය | (i) චිත්‍රපට කුලී ආදායම සහ වාර්ෂිකව අයකර ගත යුතු බදු මුදල් පිළිබඳ අධීක්ෂණයක් නොවීම.<br>(ii) සිනමාශාලාවලින් මුදලින් ලද ආදායම තහවුරු කර නොගෙන නිෂ්පාදකයාගේ කුලී ආදායම් කොටස ගෙවීම. |

| | |
|---|---|
| (ඈ) ණය පාලනය | චිත්‍රපට ප්‍රචාරණ ණය මුදල් අයකර ගැනීමේදී ගිවිසුම් ප්‍රකාරව පළමු ආදායමින් අය නොකිරීම. |
| (ඉ) පරිසණක මෘදුකාංග පද්ධති පාලනය | (i) එක් එක් නිලධාරීන්ගේ තනතුරු සඳහා හා පෞද්ගලික මුරපද ලබා නොදීම.<br>(ii) ප්‍රධාන ගොනුවේ දත්ත වෙනස් කිරීම මාණ්ඩලික නොවන නිලධාරීන් විසින් සිදු කිරීම සහ අධීක්ෂණයක් නොමැති වීම.<br>(iii) ලබාගන්නා වූ උපස්ථක (backup) එම ස්ථානයේම තැබීම.<br>(iv) Teamviewer මෘදුකාංග සහ අන්තර්ජාල පහසුකම් මගින් පිටස්තර පුද්ගලයින්ට වැටුප් සැකසීමේ පද්ධතියට ඇතුල්වීමේ අවදානමක් පැවතීම. |